දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී සෑම මාධ්‍යයක්ම ප්‍රවේසම් සහගත වීම සහ ඒ පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීම අත්‍යාවශ්‍ය වන්නේ, දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය වාර්තා හේතු කොටගෙනද දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බැවිනි.

දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන් මූලිකවම මුද්‍රිත මාධ්‍ය සඳහා හඳුන්වා දී තිබුණත්, රූපවාහිනී මාධ්‍ය වුවත් එම ආචාර ධර්මයන්ට අනුකූල වීම අවශ්‍ය වේ.

ඊට උදාහරණ ලෙසින් දිවයින පුවත්පතේ (07/19) "ඔන්ලයින් යන්න දුරකථනය නැතිව දරුවාට දිවිය එපාවෙයි" යන සිරස්තලයෙන් යුතුව පළවූ පුවත් වාර්තාව දැක්විය හැක. මෙහි දිවි තොර කර ගැනීමේ පුවත ප්‍රමුඛතාවයකින් යුතුව පළ කොට ඇති අතර, උපකාරක අංකද සඳහන් කර නොමැත.

මෙම පුවත "හිරු පත්තරේ විස්තරේ" සහ "දෙරණ අරුණ" යන පුවත්පත් කියවන වැඩසටහන් ඔස්සේද ඉදිරිපත් විණි. නමුත් එහිදීද උපකාරක අංක සඳහන් කිරීමක් දක්නට නොලැබුණි.

මෙවැනි පුවත් වාර්තාවන් නැවත ඉදිරිපත් කිරීමේදී පවා හදිසි උපකාරක අංක පළ කිරීමට මාධ්‍ය වගකීම් සහගත වන්නේ නම්, දිවි තොරකරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට යම් ඉඩක් හෝ ලැබෙනු ඇත.

මූලාශ්‍ර:

https://www.hhs.gov/.../what-does-suicide.../index.html https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #DeranaAruna #Paththarewisthare #Divaina**